4,102ක් ලෙස පෙර වසරට වඩා මිදුණ් පහළ අගයක් වාර්තා කළ බවද පෙන්වා දෙයි. ඒ අනුව, ආර්ථික කටයුතුවල මධ්‍යස්ථ වර්ධනය හමුවේ සේවා වියුක්ති අනුපාතිකයේ සුළු ඉහළ යෑමක් හා ශුම බළකා සහභාගිත්ව අනුපාතයේ පහළ යෑමක් වසර තුළදී නිරීක්ෂණය කළ බවද මහ බැංකුව කියයි.

ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයේ හිඟයක්

ඉතිහාසයේ ප්‍රථම වතාවට වෙළෙඳ හිඟය ඒ.ජී.ඩොලර් බිලියන 10 ඉක්මවූ බව පෙන්වා දෙන මහ බැංකුව, සේවා අපනයන සැලකිය යුතු ලෙස ඉහළ ගියද වෙළෙඳ හිඟය වැඩිවීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මන්දගාමීවීම සහ විදේශීය ණය මත පොළී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් පංගම හිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 3.2ක් දක්වා පුළුල් වූ බව කියයි. 2018 වසරේදී මෙතෙක් වාර්තා වූ ඉහළම විදේශීය සෘජු ආයෝජන මට්ටම මෙන්ම, විදේශයෙන්ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් හරහා විදේශීය ණය ලබාගැනීමද මුල්‍ය හිණුමේ ශේෂයට සහාය වූ බව කියන මහ බැංකුව, මෙම ප්‍රවණතාවල සමස්ත ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය, හිඟයක් ලෙස වාර්තා වූ බව පෙන්වා දෙයි.

දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළ වෙත මැදිහත්වීම්

2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කළ වෙළෙඳ පොළ මත පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මධ්‍යස්ථ රැසිපැල නිසුණු ලෙස අවප්‍රමාණය වීමට ඉඩ හැරිය නමුදු, විදේශයෙන්ම විශාල ප්‍රාග්ධන ගලායෑමක් සිදුවිය හැකිස්ථාවලදී සහ අනිසි සම්පේක්ෂණ කටයුතු හේතුවෙන් වෙළෙඳ පොළෙහි අධික උච්චාවචන ඇතිවිය හැකිස්ථාවලදී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළ වෙත මැදිහත් වූ බවද පෙන්වා දෙයි. ඒ අනුව, පුළුල් වෙමින් පැවැති වෙළෙඳ හිඟයට පිළිසමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම සඳහා තීරු බදු ඉහළ නැංවීම, ආන්තික තැන්පතු අවශ්‍යතා පනවමින්, ණෝරාගත් ණය කාණ්ඩ කිහිපයක් සඳහා වරිපනාමක මත වූ ණය අනුපාතික දැඩිව කැපීම සහ සහනදායී ගැලපූ මත ආභාන ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීම අත්හිටුවීම වැනි ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබූ බවත්, මෙමඟින් සාහ ගෙවීම්ය ශේෂය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී වූ 0.02%ක අතිරික්තයට සාපේක්ෂව දක්වා වැඩි වූ බවත්, ඒ සඳහා විදේශීය ණය ගෙවීමේ රැසිපැල් වටිනාකම් මත බලපෑම් කරමින් රැසිපැල අවප්‍රමාණය වීම, සාපේක්ෂ වශයෙන් පහළ නාමික ද.දේ.නි. සහ අදාළ කාලය තුළ ලබාගත් ඉහළ ඉල්ලුම් අගය ගැනීම් හේතු වූ බව මහ බැංකුව කියයි.

බැංකු අංශයේ ලාභදායීත්වය අඩුවීමක්

බැංකු අංශයේ සිදුවූ මධ්‍යස්ථ වර්ධනය හේතුවෙන් ස්ථාවර වර්ධනය හේතුවෙන් වසර තුළදී මූල්‍ය අංශය ඉහළම් වසර තුළදී බැංකු අංශයේ ලාභදායීත්වය අඩුවූ බව මහ බැංකුව පෙන්වා දෙයි. ඒ අතර, බලපතලාභී මුදල් සම්බන්ධී සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සම්බන්ධී අංශයද, අර්ථසාධක අරමුදල් පරිපාලක තුළ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ථසාධක් තත්ත්වයක්ට මුලුණ දුන් බලපතලාභී මුදල් සම්බන්ධී නැවත හඳුනාවිටීම සහ එම අංශයේ දිගු කාලයක් පුරා පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත් බවත් පවසා සිටියි.

'මැදි ආදායම් උගුලෙන්' මිදීමට අවශ්‍ය දුරදර්ශී විමක්

පසුගිය වසර කිහිපය තුළ රටෙහි සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑමට දැරූ ප්‍රයත්න මධ්‍යයේ වුවද, අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාදවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මන්දගාමී වර්ධන මාවතකට පත්ව ඇති බව පවසන මහ බැංකුව, දිගුකාලීන පමණ වෙර මැදි ආදායම් ඉක්බන රටක මිථ්‍යමට පත් වූ ශ්‍රී ලංකාවට 'මැදි ආදායම්



1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 35 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 69 වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමී මහතා විසින් මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත පිළිගැන්වීම සඳහා සිදුවිය.

මෙම අවස්ථාවට මුදල් රාජ්‍ය අමාත්‍ය ඒරාන් වික්‍රමරත්න, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මුදල් මණ්ඩල සාමාජික ආචාර්ය ආර්. එච්.එස්. සමරතුංග, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපනිධිපති ඒ.ජයේජස අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, සහකාර අධිපතිනි ජිවර්ණා ගුණරත්න, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ආචාර්ය වසන්ත අමරසේකර සහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය පී.කේ.පී. හර්ෂචන්ද්‍ර යන මහත්මා මහත්මීන් මෙම අවස්ථාවට එක්වූහ.

තනි අඩු අගයක පැවතුණු බවත්, 2018 වසර තුළදී පැවතුණු හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර බෝහොමියක මීල ගණන් පහළ ගිය අතර, මතුපිට උද්ධමනයේ උච්චාවචනයන් ආහාර කාණ්ඩයේ මීල විචලනයන් හා බෙහෙවින් සම්බාමී වූ බවත් මහ බැංකුව කියයි.

දේශපාලන අවිනිශ්චිතභාවයෙන් රාජ්‍ය ආදායමට බලපෑම්

රාජ්‍ය අංශයේ ආදායම් රැස්කිරීමෙහි අඩුවීමක් පැවතියද ඉහළ ප්‍රාථමික අතිරික්තයක් සහ පහළ අයවැය හිඟයක් සමඟ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් 2018 වසර තුළදී කිසියම් වැඩිදියුණු වීමක් පෙන්නුම් කළ බව පවසන මහ බැංකුව, 2018 වසරේදී රාජ්‍ය ආදායම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 13.3%ක් දක්වා අඩු වූ බවත්, විදේශයෙන්ම වසරේ අවසාන කාලය තුළ පැවැති දේශපාලනික අවිනිශ්චිතභාවයත් සමඟ අයවැය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදය නිසා රාජ්‍ය ආයෝජන අඩුවීම හේතුවෙන් වියැමි සහ ශුද්ධ ණයදීම් අඩු වූ බව පවසයි. ඒ අනුව, ආර්ථික කටයුතු මන්දගාමී වීම සඳහා රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් අඩුවීමද දායක වූ බව මහ බැංකුව පෙන්වා දෙයි.

අයවැය හිඟය අපේක්ෂිත ඉලක්කයට ළඟා නොවීමක්

රජයේ මූල්‍ය ඉගෙනුම් පිළිබිඹු කෙරෙහි වර්තමාන හිණුමේ හිඟය 2018 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිමේදී ඉහළ ගිය බවත්, රාජ්‍ය ආදායම් සහ පොළී ගෙවීම් හැර වියදම් අතර වෙනස පිළිබිඹු කරන ප්‍රාථමික ශේෂය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී වූ 0.02%ක අතිරික්තයට සාපේක්ෂව

කොමර්ෂල් ක්‍රෙඩිට් නගර කාර්යාලය බොරැල්ලට

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා අංශය තුළ මවුපිණිස් පදනම් තවදුරටත් ස්ථාවර කරගනිමින් සමාගමේ නගර කාර්යාලය බොරැල්ල නගරයේ නැවත ස්ථාපිත කිරීමට කටයුතු කර ගිණිමි.

ධර්මපාල මාවත, කොළඹ 07 පිහිටි ශාඛාවට අමතරව කොළඹ 08, කිංසි පාර, අංක 165 යන ස්ථානයේ විවෘත කරන ලද මෙම කාර්යාලය ඔස්සේ සමාගමට තම ගනුදෙනුකරුවන් වෙත වඩා හිසිල්ට සේවාවන් සැපයීමට හැකිවන බවත්, මෙම නගර කාර්යාලය ස්ථාපිත කිරීමේදී සමඟ දීර්ඝ කාල පරිසීමා 118ක් පුරා සමාගමේ ශාඛා සහ සේවා ස්ථාන ජාලයට තවත් එක් කිරීමක් සිදුවන බවත් බලාපොරොත්තු වැඩිදුරටත් පවසයි.

'සංචාරක පැමිණීම් 30%කින් පමණ අඩුවේවි'

ආර්ථිකයට අ.ඩො.බිලියන 1.5කවත් පාඩුවක්

ඉක්මනින් යථා තත්ත්වයට පත්වෙන්න පුළුවන්

- මුදල් අමාත්‍ය මංගල සමරවීර

■ **මලිඳ පෙරේරා**

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සමඟ සංචාරකයන්ගේ පැමිණීම 30%කින් පමණ අඩුවී, අ.ඩො.බිලියන 1.5ක පමණ පාඩුවක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇතිවිය හැකි බව මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා පවසා සිටියේය.

ශ්‍රී ලංකාවේ ඇතිවී තිබෙන එම්මන් තත්ත්වය සම්බන්ධයෙන් පසුගිය 26වා විශේෂ මාධ්‍ය හමුවක් කැඳවමින් අමාත්‍යවරයා මෙසේ අදහස් දක්වා සිටියේ මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේදීය. එහිදී, වැඩිදුරටත් අදහස් දක්වූ මංගල සමරවීර මහතා,

"මේ සිද්ධිය සමඟ වෙන්න පුළුවන් චක් දෙයක් තමයි, අපේ ආර්ථිකයට වින හානිය. විශේෂයෙන්ම, සංචාරක කර්මාන්තය බිඳ වැටීමෙන් ඒ තත්ත්වය ඇති වෙන්න පුළුවන්. සංචාරකයන්ගේ පැමිණීම 10%කින් පහළ වැටුණොත් අපට අ.ඩො.බිලියන 500ක පමණ පාඩුවක් සිදුවෙනවා. අපි හිතනවා මේ සිද්ධිය නිසා සංචාරකයන්ගේ පැමිණීම 30%ක් වගේ ප්‍රමාණයකින් අඩුවෙයි කියලා. ඒ අනුව, අ.ඩො. බිලියන 1.5ක වගේ පාඩුවක් සිදුවෙයි කියලා අප හිතනවා.

නමුත් අපේ ආර්ථිකය පවතින තත්ත්වයන් යටතේ මේ තත්ත්වයන්ට මුහුණදීමේ ශක්තියක් අපට ලබා තත්ත්වයට පත්වෙනවාට පුළුවන්. ඊශ්ස්ටර් වසර විකතමාරක වෙල් කාලයක් තුළ යථා තත්ත්වයට පත්වුණා. ඉන්දුනීසියාව, ඊජිප්සියාව වගේ රටවල් යථා තත්ත්වයට පත්වුණා. උද්ධමනය අඩු වෙමින්, බැංකු පොළී අනුපාත අඩු වෙමින්, රාජ්‍යය ශක්තිමත් වෙමින්, අනෙකුත් ශක්තිමත් වෙමින් තියෙන මේ මොහොතේ අපට මේ තත්ත්වයන්ට පහසුවෙන් මුහුණ දෙන්න හැකියි.

ගෝලීය ත්‍රස්තවාදී දර්ශකයට අනුව (Global Terrorism Index) ලෝකයේ සෑම රටකම පාහේ ප්‍රහාරයක් එල්ලවීමේ යම් අවදානම් මට්ටමක් තිබෙනවා.

සෑම රටකම ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත්වීමේ අවදානමක ඉන්නේ. ඒ නිසා මේ රට අසාමූ නවවන යුද්ධයක් ඇතිවීමේ අවදානමක් නොවෙයි ඇති වෙලා තියෙන්නේ. ඒ නිසා රට පුරා මුරපොළවල් දාලා, රට යුදු මානසිකත්වයකට පත් වීය යුතු අවස්ථාවක් නොවෙයි කේ. අපි කළ යුත්තේ අපේ එදිනෙදා කටයුතු ඒ ආකාරයෙන්ම සිදුකරන ගමන් දැඩි අවධානයෙන් පසුවීමයි. එමනම නැතුව රජයට ලොස් නගලා හෝ බුද්ධි අංශවලට ලොස් නගලා මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්න බෑ. ඒ නිසා රට තුළ ගොනොගෙම්මන් හිටුණ සහෝදරත්වය විනාශ කිරීමට කිසිවෙකුටත් ඉඩ දෙන්නා බෑ. අපි ලෝකය සමඟ තිබිච ශ්‍රී ත්‍රස්තවාදය ආණ්ඩු දැක්මෙන් අන්වලල් බැඳගෙන යුතුයි."

යනුවෙන් පවසා සිටියේය.

මොබිටෙල්, UTECH Technologies සමඟ සහයෝගීතාවකට

ජාතික ජංගම දුරකථන ජාලය වන මොබිටෙල්, IIoT (Industrial Internet of Things) විසඳුම් ලබාදීම සඳහා UTECH Technologies සමඟ උපායමාර්ගික සහයෝගීතාවක් ඇති කරගෙන තිබේ.

IIoT විසඳුම් බහුකාර්යක්ෂම ඔත්ත

විනාපාර සංවේදකයන් සහ ඉන්ටර්නට් කාර්යක්ෂමතාව වැඩිවී වලදාසිනාව උපරිමයට වැඩිකර ගැනීමෙන් සම්පූර්ණ කර්මාන්තයේ ලාභය වැඩිකර ගැනීමට හැකියාව ලැබෙන බවත්, GSMA විනාපාර දත්තවලට අනුව 2025 වනවිට බිලියන 11කට වඩා ඉලුත වත්තම සමඟ වර්තමාන ලෝකයේ ඒකකයේම වර්ධනය වන ක්ෂේත්‍රයක් ලෙස IIoT හඳුන්වා දිය හැකි බවද මතුපිට පවසයි.